සිංහල පරිවර්තනයකි

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභියාචනාධිකරණයේදීය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140වන ව්‍යවස්ථාව ප්‍රකාර, සර්ටියෝරාරි ප්‍රොහිබිෂන් සහ මැන්ඩමස් රිට් ආඥා ලබා ගැනීමේ ඉල්ලීම පිළිබඳ කාරණයයි.

නිහාල් ශ්‍රී අමරසේකර,
අංක. 167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

පෙත්සම්කරු

අභියාචනාධිකරණ අංක. 1661/2003 - එදිරිව -

01. කන්දයියා සුසිලර්,
දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා,
සර් විත්තම්පලම් ඒ.ගාඩිනර් මාවත,
කොළඹ 02.

02. එස්.ඒ.සී.එස්.ඩබ්.ජයතිලක,
රේගු අධ්‍යක්ෂක ජනරාල්වරයා,
රේගු නිවාස, බ්‍රිස්ටල් වීදිය,
කොළඹ 01.

03. පරාක්‍රම ඒකනායක බන්ඩාර,
සුරාබදු කොමසාරිස්,
28, ස්ටේපල්ස් වීදිය,
කොළඹ 02

04. රන්ජන් සමරවීර,
අපනයන සහ ආනයන පාලක,
75 1/3, 1වන මහල, හේමාස් ගොඩනැගිල්ල,
යෝර්ක් වීදිය, කොළඹ 01.

05. එච්.ඒ.ජ.හෙට්ටිආරච්චි,
විනිමය පාලක,
ශ්‍රී ලංකාමහ බැංකුව,
5වන ටවරය, ලෙවල් 7,ජනාධිපති මාවත,
කොළඹ 01.

06. ඒ.එස්.ජයවර්ධන,
ශ්‍රී ලංකා මහ බැංකු අධිපති,
සභාපති, ශ්‍රී ලංකා මූල්‍ය මණ්ඩලය,
1වන ටවරය, ලෙවල් 15,
30, ජනාධිපති මාවත,
කොළඹ 01.

07. ආනන්ද කුමාරස්වාමි,

සභාපති, අල්ලස් හා දූෂණ, චෝදනා,විමර්ශන කොමිසම,
36, මලලසේකර මාවත,
කොළඹ 07.

08. චරිත රත්වත්ත,
මුදල් අමාත්‍යංශයේ සහ මහභාණ්ඩාගාරයේ ලේකම්,
මහලේකම් කාර්යාලය,
කොළඹ 01.

09. කේ.එන්.චොක්සි,
මුදල් අමාත්‍යංශය,
මහලේකම් කාර්යාලය,
කොළඹ 01.

10. ගරු ජෝෂප් මයිකල් පෙරේරා,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

11. ඩබ්.ජේ.එස්.කරුණාරත්න,
ජනාධිපති කාර්යාලීය ලේකම්,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01

12. ජනාධිපති නීතිඥ කේ.සී.කමලසබේසන්,
ගරු නීතිපතිතුමා,
නීතිපති දෙපාර්තමේන්තුව.
කොළඹ 12

<u>වගඋත්තරකරුවන්</u>

<u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභියාචනාධිකරණයේ සභාපති උත්තමාවිය සහ අනෙකුත් විනිසුරු උතුමන්ලා වෙතය,</u>

වර්ෂ 2003 වූ සැප්තැම්බර් මස 29 වන දිනදීය

**ආබ්දීන් ඇසෝෂියේට්ස්** යන නාමය හා විලාශය යටතේ වෘත්තිමය කටයුතු කරන නීතිඥ රාස්මාරා ආබ්දීන් සහ ඔහුගේ සහයකයන් වන නිතිඥ බුෂ්රා මුහිසා හෂිම් මෙනවිය, නීතිඥ මංජුලා පැස්කුවල් මහත්මිය, නිතිඥ චමරි තරංගා අතුකෝරල මෙනවිය සහ නීතිඥ හොරගොඩ ගමගේ නදීජා ප්‍රගති මෙනවිය මගින් පෙනී සිටින ඉහත නම් සඳහන් පෙත්සම්කරු සිය පෙත්සමේ මෙසේ ප්‍රකාශ කර සිටි.

01. පෙත්සම්කරු,

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියෙකි,

(ආ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහ එක්සත් රාජධානියේ වරලත් කළමණාකරණ සහ ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙක් වන අතර, සහ

(ඇ) ලෝක බැංකුව සහ USAID මගින් මූල්‍යනය කරන ලද ශ්‍රී ලංකා ආණ්ඩුවේ ආර්ථික යටිතල හා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති සම්බන්ධ ජ්‍යෙෂ්ඨ උපදේශක වශයෙන් හා මුදල් අමාත්‍යාංශයේ උපදේශකවරයකු ලෙස කටයුතු කරන ලද අතර, දැනට උපදේශකවරයකු වශයෙන් කටයුතු කරයි.

02. පෙත්සම්කරු විසින් මෙම පෙත්සම ජාතික හා මහජන යහපත උදෙසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අයිතිවාසිකම් ක්‍රියාත්මක කරමින් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වූ ස්වකීය කාර්යයන්, විශේෂයෙන්ම එහි 28වන ව්‍යවස්ථාව යටතේ,

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නීතිය ආරක්ෂා කොට අනුගමනය කිරීම,

(ආ) ජාතික අභිවෘද්ධිය වර්ධනය කිරීම,

(ඇ) පොදු දේපළ සුරක්ෂිත කොට ආරක්ෂා කිරීම,

(ඈ) පොදු දේපළ අයථා පරිදි ප්‍රයෝජනයට ගැනීමට සහ නාස්ති කිරීමට එරෙහිව ක්‍රියා කිරීම,

පිණිස තමා වෙනුවෙන් සහ පොදු ජනතාව සඳහා සහ වෙනුවෙන් ඉදිරිපත් කර සිටිනු ලැබේ.

03. (අ) 1වන වගඋත්තරකරු දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වේ. 2003 අංක. 10 දරණ දේශිය ආදායම් (විශේෂ විධිවිධාන) පනතේ උපලේඛණයෙහි ලැයිස්තු ගත කර ඇති ඇතැම් ව්‍යවස්ථා සම්බන්ධයෙන් ඒ 2003 අංක. 10 දරණ පනත යටතේ ඔහු වෙත " ප්‍රකාශ කිරීම්" කළ යුතුව ඇති අතර, ඔහු විසින් එකී ප්‍රකාශකයන් වෙත " ලිඛිත පිළිගැනීම්" නිකුත් කළ යුතුය. ඔහු විසින් එවැනි ප්‍රකාශයන්ට සමාව ප්‍රදානය කළ යුතුය.

(ආ) 2වන, 3වන, 4වන, 5වන හා 6වන වගඋත්තරකරුවන් වූ කලී රාජ්‍ය නිලධාරීන් වන අතර, ඔවුන් වෙත 2003 අංක. 10 දරණ එකී පනතේ උපලේඛණයේ ලැයිස්තු ගත කර ඇති එකී ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීමේ බලතල පවරනු ලැබ ඇත. තවද, ඔවුන් විසින් එකී ව්‍යවස්ථාවල විධිවිධාන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් දැන් ඉහත කී ප්‍රකාශයන්ට සමාවදීම් කරනු ලැබිය යුතුය.

(ඇ) 7වන වගඋත්තරකරු වූ කලී අල්ලස් හෝ දූෂණ විමර්ශණය කිරීම පිණිස වූ කොමිෂන් සභාවේ සභාපතිවරයා වේ. **එම කොමිෂම ඉහත කී ප්‍රකාශයන් හඳුනාගැනීම පිණිස 1වන වගඋත්තරකරුගෙන් තොරතුරු ලබා ගැනීමෙන් වලක්වනු ලැබ නැති අතර, 2003 අංක. 10 දරණ පනත යටතේ වූ ඔවුන්ගේ " ප්‍රකාශවල" අන්තර්ගත කිසියම් තොරතුරක් ලබා ගැනිමද වලක්වාලනු ලැබ නැත.**

(ඈ) 8වන වගඋත්තරකරු වූ කලී මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ භාණ්ඩාගාරයේ ලේකම්වරයාද වේ. 9වන වගඋත්තරකරු මුදල් අමාත්‍යවරයා වේ. 1වන, 2වන, 3වන, 4වන හා 5වන වගඋත්තරකරුවන්, 8වන හා 9වන වගඋත්තරකරුවන්ගේ විෂය පාත්‍රතාව, මෙහෙයවීම හා පාලනය යටතේ, විශේෂයෙන්ම 2003 අංක. 10 දරණ පනතට අදාලව ක්‍රියාත්මක වේ. තවද, 9වන වගඋත්තරකරුට 2003 අංක. 10 දරණ පනතේ 8වන වගන්තිය යටතේ නියෝග සෑදීමේ බලයද ඇත.

(ඉ) 10වන වගඋත්තරකරු වූ කලී ගරු පාර්ලිමේන්තු කථානායකවරයා වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව, පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ ඇතුලත් කිරීමට සහ/හෝ ඒ ගැන ක්‍රියාකොට තමා විසින් සහතික කිරීමට පෙර, ඒ පනත් කෙටුම්පත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අධිකාරයට, කාර්ය පටිපාටියට, සීමාකිරීම්වලට සහ තහනම් කිරීම්වලට අනුකූල බව සහතික කිරීමට සහ ඒ බිල්පත් මහජනයා විසින් මහජනයා වෙනුවෙන් භාරයේ ක්‍රියාත්මක කරනු

ලැබීම පිණිස පාර්ලිමේන්තුව වෙත පවරා දී ඇති සීමිත ව්‍යවස්ථාදායක බලයේ පරසීමාව ඇතුළත ද යන බවට සහතික වීමටද බැඳී සිටින තැනැත්තා වේ.

(ඊ) 11වන වගඋත්තරකරු අතිගරු ජනාධිපතිනියගේ ලේකම්වරයා වේ. අමාත්‍ය මණ්ඩල වෙත 2003 අංක. 10 දරණ පනත සම්බන්ධයෙන් වාර්තාවක් අමාත්‍ය මණ්ඩලය වෙත යවමින් වෙනත් දේ අතර, **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34වන ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීමද**, ජනාධිපතිනිය වෙත පැවරී ඇති සමාවදීමේ එකම සහ තනිකරම වූ බලය වෙනස් කිරීම සහ/හෝ අන්සතු කිරීමද **මුදල් විශෝධනයට අදාළ ජාත්‍යන්තර නීති සහ ගිවිසුම් උල්ලංඝණය කිරීමද ත්‍රස්තවාදීන් සහ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්වලට මූල්‍යාධාර සැපයීමද** ගැන පෙන්වා දෙමින් 2003 අංක. 10 දරණ පනත ඉවත් කරන ලෙස ඔහු විසින් ඉල්ලා සිටින ලදී.

(උ) 12වන වගඋත්තරකරු ගරු නීතිපතිවරයා වේ.

04. 53වන සහ/හෝ 61වන සහ/හෝ 165 වන ව්‍යවස්ථා අනුව, රාජ්‍ය නිලධාරින් වන 1 සිට 12 දක්වා වූ වගඋත්තරකරුවන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඒ ඒ රාජ්‍ය නිලයේ කර්තව්‍ය අවංක ලෙස ඉටුකිරීමටද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හතරවැනි උපලේඛණයේ ඇති නිල දිවුරුම/සහතික කිරීම ගැනීම අනුව සහ ඒ යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කොට පිළිගැනීමට ද බැඳී සිටින අතර, ඊට අමතරව පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් වශයෙන් 9වන හා 10වන වගඋත්තරකරුවෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 63වන ව්‍යවස්ථාව අනුව ආරක්ෂා කොට පිළිගැනීමටද බැඳී සිටිති.

05. (අ) 2003 අංක. 10 දරණ පනතින් එහි 2වන වගන්තිය යටතේ "ප්‍රකාශකයන්" විසින් "ප්‍රකාශයන්" **2003.06.30 වන දිනට හෝ ඊට ප්‍රථම** 1වන වගඋත්තරකරු වෙත කිරීම පිණිස විධි විධාන සලසා ඇත. එවැනි ප්‍රකාශකරුවන්ට 2003 අංක. 10 දරණ පනතෙහි විධිවිධාන සලසා ඇති පරිදි සමාව/වගකීමෙන් ආරක්ෂා කිරීම/නිරමුක්තිය/සමාකිරීම් ලබා ගැනීමට හිමිකම් ඇත.

(ආ) 1වන වගඋත්තරකරු වෙත එවැනි "ප්‍රකාශ" කිරීමද ඒවා සඳහා 1වන වගඋත්තරකරු විසින් ලිඛිත පිළිගැනීම් නිකුත් කිරීමද ඉන් අනතුරුව, ඒ සමාව/වගකීමෙන් ආරක්ෂා කිරීම/නිරමුක්තිය/සමාකිරීම් ලබාදීම **2003.06.30 වන දින අවසන් විය.**

06. 9වන වගඋත්තරකරුගේ ඉල්ලීම පිට 8වන වගඋත්තරකරුවන් විසින් ක්‍රියා කරමින් 2003.06.30 වන දින හෝ තදාසන්න දිනකදී 2003 අංක. 10 දරණ පනත යටතේ එවැනි "ප්‍රකාශ කිරීම්" සඳහා **අවසාන දිනය 2003.06.30 වන දින සිට 2003.08.15 වන දින දක්වා දීර්ඝ කිරීම** සඳහා අවශ්‍ය සංශෝධන ව්‍යවස්ථා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බවට මහජනයා වෙත දන්වා සිටිමින් ප්‍රවෘත්ති පත්‍රවල දැන්වීම් පළකරන ලදී.

07. (අ) 2003 අංක. 10 දරණ දේශිය ආදායම් (විශේෂ විධි විධාන) පනත සංශෝධනය කිරීම පිණිස වූ (මෙහි මින්මතු "සංශෝධන පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) දේශිය ආදායම් (විශේෂ විධිවිධාන) සංශෝධන පනත නමැති පනතක් **2003.07.25** වන දින පාර්ලිමේන්තුවේ න්‍යාය, පුස්තකයේ ඇතුලත් කරන ලද අතර, එය පක්ෂව ඡන්ද 98ක් සහ විපක්ෂව ඡන්ද 67ක් ලැබීමෙන් 2003.08.21 වන දිනදී පාර්ලිමේන්තුව විසින් සාමාන්‍ය බහුතරයෙන් සම්මත කරගන්නා ලදී.

(ආ) සංශෝධන පනතින් අපේක්ෂා කරන ලද්දේ ප්‍රකාශකරුවන් විසින් 1වන වගඋත්තරකරු වෙත එවැනි ප්‍රකාශ කිරීම් කළ යුතු **අවසාන දිනය 2003.06.30 වන දින සිට 2003.08.15 වන දින දක්වා දීර්ඝ කිරීමය.**

(ඇ) 2003.08.02 වන දින පාර්ලිමේන්තුවේ කාරක සභා අවස්ථාවේදී එකී 2003.08.15 වන අවසාන දිනය 2003.08.31 වන දින වශයෙන් ප්‍රතියෝජනය කරනලදී.

(ඇ) 9වන පෙත්සම්කරු විසින් 2003.08.21 වන දින කෙටුම්පත් පනතේ 2වන කියවීම යෝජනා කරමින්, හැන්සාර්ඩ් වාර්තාවේ සඳහන් වන පරිදි වෙනත් දේ අතර, පහත දැක්වෙන ලෙස සඳහන් කර ඇති බව වාර්තාවේ :-

" **කෙටුම්පත් බිල්පත ව්‍යවස්ථානුකූලව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අනුමත කර ඇති හෙයින්** ප්‍රකාශ ඔවුන්ගෙන් ලබා ගැනීම සඳහා දිනය දීර්ඝ කිරීමක් අපේක්ෂා කරනු ලැබේ (සැලකිල්ල යොමු කරනු ලැබේ) හැන්සාඩ් තීරුව 2429 විශේෂ කොට දක්වා ඇත) "

" ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සමාව දීමේ ජනාධිපතිවරයාගේ බලතල මෙම නීතියෙන් උදුරාගන්නා බවට සඳහන් කිරීම වැරදිය. ව්‍යවස්ථාව මගින් ජනාධිපතිවරයාට බලය දී ඇත්තේ අධිකරණයක් මගින් යම් වරදකට වරදකරු කරනු ලැබූ වැරදිකරුවකුට සමාවක් හෝ දඬුවමක් ලිහිල් කිරීමේ අධිකාරයයි. වත්මන් නීතියෙන් සිදුකරනු ලබන්නේ දැනට නිම නොවී පවතින්නාවූ ද වරදකරු, **වරදකරු කිරීමට අධිකරණය විසින් ක්‍රියා කොට නැත්තාවූද නඩු ඉල්ලා අස්කර ගැනීමය. එබැවින් ජනාධිපතිගේ බලතල සමඟ ගැටීමක් නොවේ.** (සැලකිල්ල යොමු කරනු ලැබේ) 2430 හැන්සාඩ් විශේෂකොට දක්වා ඇත)"

" සඳහන් කරන ලද පරිදි වාසිය නම් අපට යටත් පිරිසෙයින් **අළුත් ලිපිගොනු 45,000ක් ඇති වීමය.** (සැලකිල්ල යොමු කරනු ලැබේ) 2486 හැන්සාඩ් තීරුව විශේෂ කොට දක්වනු ලැබේ)"

(ඉ) 9වන වගඋත්තරකරු විසින් කරන ලද ඉහත කී ප්‍රකාශ වැරදි බව, අසත්‍ය බව හා නොමඟ යවන සුළු බව පෙත්සම්කරු ගෞරවයෙන් කියා සිටී.

08. (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79වන ව්‍යවස්ථාවේ නියමයන් පරිදි **ගරු කථානායකතුමා විසින් එකී සංශෝධන කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් නිසි ලෙස සම්මත කරන ලදී යන සහතිකය යොදා ඊට ස්වකීය පිටසන යොදා නැති බව** පැමිණිලිකරුට විශ්වාස කටයුතු ලෙස දැනගන්නට ලැබී තිබේ. එබැවින් එකී සංශෝධන කෙටුම්පත් පනත තවමත් නීතිය බවට පත්වී නැති බවට පෙත්සම්කරුට උපදෙස් ලැබී තිබේ.

(ආ) ඉහත කී කරුණු අනුව-

(i) <u>2003.07.01</u> දින සිට <u>2003.08.31</u> වන දින දක්වා වූ කාලය තුළ ප්‍රකාශකරුවන්නේ "ප්‍රකාශ" ලබා ගැනීමට 1වන වගඋත්තරකරුට ව්‍යවස්ථාපිතව අධිකාරය දී/බලය පවරා දී නැති බවත්, එවැනි ප්‍රකාශකරුවන්ට ලිඛිත පිළිගැනීම් නිකුත් කිරීමට නොහැකි බවත්,

(ii) <u>2003.07.01</u> සහ <u>2003.08.31</u> දින දක්වා වූ කාලය තුළදී කරන ලද ප්‍රකාශ සම්බන්ධයෙන් කිසියම් සමාවක්/වගකීමෙන් ආරක්ෂා කිරීමක්/නිර්මුක්තියක්/සමාකිරීමක් දීමට 1වන සහ/හෝ 2වන සහ/හෝ 3වන සහ/හෝ, 4වන සහ/හෝ, 5වන සහ/හෝ, 6වන සහ/හෝ, 7වන සහ/හෝ, 8වන සහ/හෝ, 9වන සහ/හෝ 12වන වගඋත්තරකරුවන්ට ව්‍යවස්ථාමය වශයෙන් අධිකාරය/බලය ලැබී නැති බවත්,

පෙත්සම්කරු කියා සිටී.

(ඇ) **<u>සංශෝධන පනත් කෙටුම්පත කථානායකවරයා විසින් කරනු ලබන එකී සහතිකයේ දින සිට පමණක් නීතිය බවට පත්වන අතර, එහි නීතියේ අදාළවීම සිදුවනුයේ එදින සිටය.</u>** එමගින්, 2003.07.01 සිට 2003.08.31 දින දක්වා 1වන වගඋත්තරකරු වෙත භාරදෙන ලද ප්‍රකාශ කිරීම් සම්බන්ධයෙන් 1වන සහ /හෝ 2වන සහ/හෝ, 3වන සහ/හෝ, 4වන සහ/හෝ, 5වන සහ/හෝ, 6වන සහ/හෝ, 7වන

සහ/හෝ, 8වනසහ/හෝ, 9වන සහ/ හෝ , 12වන වගඋත්තරකරුවන් විසින් කරන ලද සහ ඉටු කරන ලද කවරාකාරවූ හෝ සියළු ක්‍රියා කටයුතු කරුණු හා දේවල **මුල පටන් ශුන්‍ය හා බලරහිත වන අතර, නීතියට අනුව වලංගු නොවේ.**

09. (අ) 2වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව, එහි 3වන ව්‍යවස්ථාව පරිදි, පනතක් අතීතයට බලපාන ලෙස පනවනු ලැබ ඇති සේ සලකනු ලබන්නේ, **එහි ඒ පනත කලින් දිනයක සිට බලපැවැත්වෙන බවට ප්‍රකාශිතවම සඳහන් කර ඇත්තේ නම් පමණි.** "පනතේ 2වන වගන්තියේ විධිවිධාන සියළු කාර්යය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරම්භවීමේ දිනයෙන් පසු බලාත්මක වූ ලෙස සැලකිය යුතුය. "

(ආ) 2003 අංක. 10 දරණ පනතේ 11වන වගන්තියේද, එවැනි ඡේදයන් එනම් " 2003 අංක. 10 දරණ පනතින් ඉවත් කරන ලද 2002 අංක.7 දරණ දේශිය ආදායම් (විශේෂ විධි විධාන) පනත යටතේ කලින් කරන ලද ප්‍රකාශ 2003 අංක. 10 දරණ පනතේ 2වන වගන්තිය යටතේ කරනු ලැබූ ප්‍රකාශ ලෙස සලකනු ලැබිය යුතුය. "

(ඇ) කලින් කරන ලද ක්‍රියා වලංගු කිරීම සඳහා, 1984 අංක. 44 දරණ නාගරික සංවර්ධන අධිකාරිය (විශේෂ විධි විධාන) පනතේ ඇති 2වන වගන්තිය තවත් උදාහරණයකි.

10. (අ) පෙත්සම්කරුගේ එස්.සී (එස්ඩී) ඉල්ලුම්පත් අංක.20/2003 නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද 12වන වගඋත්තරකරුගේ ලිඛිත සැලකිරීම්වල වෙනත් දේ අතර, 17වන ඡේදයෙහි පහත සඳහන් ලෙස දැක්වේ:-

**" 2වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශ කිරීමේ දිනය 2003.06.30 වන දින අවසන් වුයේ නමුදු 2වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශ අඛණ්ඩව පිරිසැකසුම් කරගෙන යන අතර, 2003.06.30 වන දිනෙන් පසුවද, තවමත් පිරිසැකසුම් කරගෙන යනු ලැබේ"** (යොමුව 2003 අංක. 10 දරණ පනත) (සැලකිල්ල යොමු කරනු ලැබේ).

(ආ) 2003.08.12 දරණ ඉහත කී ලිඛිත සැලකිරීම්වල 31වන හා 31වන ඡේදයන් හි 12වන වගඋත්තරකරු විසින් වෙනත් දේ අතර සඳහන් කර ඇත්තේ **"දඩයක් වරදකරු කිරීමක් නොවන බවය.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34වන ව්‍යවස්ථාව යටතේ සමාවක් දීම සිදුවන්නේ, **වරදකරු කිරීම** " සම්බන්ධයෙන් පමණකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34වන වගන්තියෙන් සමාවදීම සඳහා ජනාධිපතිවරයා වෙත පවරා දී ඇති බලය අනන්‍ය නොවේ. **විධායක කර්තව්‍යයන්හිදී මෙන් සමාව දීමට ඇති බලය ප්‍රධාන ප්‍රඥප්තියේ සඳහන් කරනු ලැබ ඇති " අදාල බලධාරීන් " විසින්ද ක්‍රියාත්මක කළ හැකිය " (සැලකිල්ල යොමු කෙරේ)**

(ඇ) 2003 අංක. 10 දරණ පනත යටතේ 9වන වගඋත්තරකරු විසින් සාදන ලද්දේ යයි කියනු ලබන්නාවූද (එකක් දින නොමැති සහ අනික 2003.07.15 දින දරණ) දෙකම අත්සන් නොකළා වූද, නියෝග දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අතරෙහි සංසරණය කරනු ලැබ ඇත. එම නියෝග වල **අධිකරණවල වරදකරු කරනු ලැබීමෙන් පසුව වුවද,** දියයුතු සමාවදීම් නිශ්චිත වශයෙන්ම ඇතුළත් වන අතර, **බන්ධනාගාර ගත කිරීමේ දඬුවම්ද ඇතුළත්ව** ඉහළ අධිකරණවලට අභියාචන ඉදිරිපත් කර ඇති නඩු සම්බන්ධයෙන් සමාවදීම් ඇතුළත් වේ.

(ඈ) එනියා නියෝගවලින් එකක මෙසේ සඳහන් වේ:-

**" ප්‍රකාශකයකු විසින් අදාල නීතිය බරපතල ලෙස උල්ලංඝණය කර ඇති බවට යම් බලධාරියකුට පෙනී ගිය සහ පනත යටතේ නිර්මුක්තිය හෝ වරප්‍රසාද එවැනි ප්‍රකාශකරුවකුට ලබා නොදෙන්නා වූ අවස්ථාවක, ඒ කාරණය ඔහු විසින්**

**<u>තීරණයක් සඳහා මුදල් අමාත්‍යවරයා වෙත යොමු කළ හැකිය</u> "** (සැලකිල්ල යොමු කෙරේ).

9වන වගඋත්තරකරු විසින් දැනටමත් 12වන වගඋත්තරකරුට ප්‍රතිවිරුද්ධ වී ඇති අතර, **<u>"බරපතල උල්ලංඝණය"</u>** කිරීම් සම්බන්ධයෙන් තීරණයක් දීමේ බලය ඔහු වෙතම පවරාගෙන තිබේ. මෙසේ ඉදිරිපත් කරනු ලබන නඩුවලින් සමහරක් අමාත්‍ය ධුරය භාරගැනීමට කලින් නීතිඥයකු ලෙස තමා විසින් කටයුතු කරන ලද ඔහුගේ සේවාදායකයන්ගේ නඩු සහ කාරණා විය හැකිය.

(ඉ) ඉහත සඳහන් නියෝගවල සඳහන් කර ඇති බලධාරීන් නම් 1වන, 2වන, 3වන, 4වන, 5වන හා 6වන වගඋත්තරකරුවන්ය. පෙත්සම්කරු දැඩි ලෙස විශ්වාස කරන්නේ ඔවුන්ගේ එක් අයකු හෝ වැඩි ගණනක් 8වන වගඋත්තරකරු විසින් හෝ ඔහු යටතේ සිටින තැනැත්තකු විසින් මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරන ලෙස මිස 2003 අංක. 10 දරණ පනතේ විධි විධාන අදාල කිරීමේදී පැන නගින්නාවූ යම් කිසි කාරණා සම්බන්ධයෙන් 12වන වගඋත්තරකරුගෙන් විමසීම් කරන ලෙස උපදෙස් ලබා ඇති අය නොවන බවය.

එකී නියෝගවල සත්‍ය පිටපත් පිළිවෙලින් X4(a) හා X4(b) ලෙස ලකුණු කොට මෙයට අමුණන අතර, ඒවා මෙහිම කොටසක් ලෙස සලකන මෙන් අයැද සිටිනු ලැබේ.

11. පෙත්සම්කරුට පහත දැක්වෙන ලෙස උපදෙස් ලැබී ඇත:-

(අ) 2003 අංක. 10 දරණ පනතෙහි උපලේඛණගතකර ඇති ප්‍රඥප්ති (රේගු ආඥාපනත) විනිමය පාලන පනත්, ආනයන හා අපනයන පාලන පනත, සුරාබදු ආඥාපනත සහ සුරාබදු (විශේෂ විධිවිධාන පනත) යටතේ සඳහන් කර ඇති ඇතැම් වරදවල් වලට **අපරාධ නඩු විධින සංග්‍රහයේ ඇප නොදිය යුතු වූද, දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඩුවම් දියයුතු වූද, වරදවල් ඇතුළ වේ**. එම වරදවල් වලට දේශිය ආදායම් කෙටුම්පත් පනත වේෂයෙන්, ප්‍රයෝගයෙන් සහ ධූම පටලයෙන් ආවරණය වී ඒ යටතේ වූ විමර්ෂණ/නඩු පැවරීම්/වරදකරු කිරීම් සඳහා සමාව/නිර්මුක්තිය/සමාවදීම් කළ නොහැකිය.

(ආ) ඒ ප්‍රකාශකරුවන් විසින් 2003 අංක. 10 දරණ පනත යටතේ 1වන වගඋත්තරකරු වෙත කරන ලද යම් ප්‍රකාශයකට සම්බන්ධිත කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් 2003 අංක. 10 දරණ පනත යටතේ සමාවක් ඒ ප්‍රකාශකරුවන්ට දිය නොහැකිය. එසේ දීම නීතියේ අධිපාලනය විකෘති කිරීම සහ මහජනතාවගේ අධිකරණ බලය අන්සතු කිරීමක්ද වේ.

12. (අ) පිටපත් අතිගරු ජනාධිපතිතුමිය, 12වන වගඋත්තරකරු සහ තවත් ඇතැම් අයට යවමින්, පෙත්සම්කරු විසින් 2003.06.25 වන දින ගරු අග්‍රාමාත්‍යතුමා වෙත ලිපියක් යවන ලදි. එම ලිපියෙන් වෙනත් දේ අතර 2003 අංක. 10 දරණ පනතේ අනර්ථදායක, අවෛතනික ලක්ෂණ සහ එහි විධානවල ඇති විසදාෂ තත්ත්වයන් ඇතුළත් ව්‍යවස්ථා විරෝධි බව පෙන්නුම්කර දෙන ලදි.

(ආ) 2003.06.25 වන දින දරණ එකී ලිපියේ පිටපත් පෙත්සම්කරු විසින් යවන ලද අනිකුත් අය අතර, 1වන, 2වන, 3වන, 4වන, 5වන, 6වන, 7වන වගඋත්තරකරුවන් වෙත,

(ඇ) පෙත්සම්කරු විසින් මහජන යහපත උදෙසා ඉහත කී වගඋත්තරකරුවන්ට 2003.06. 25 දින දරණ පෙත්සම්කරුගේ ඉහත කී ලිපියෙහි සඳහන් කිසිවක් සමඟ **<u>විමසීම් කරන ලෙස/ප්‍රතික්ෂේප කරන ලෙස/විරුද්ධත්වය පළකරන ලෙස</u>** ඉල්ලා සිට ඇතත්, වගඋත්තරකරුවන් **<u>මෙදින දක්වා කිසිදු ප්‍රතිචාරයක් ලැබී නැත.</u>**

(ඈ) 2003.07.25 වන දින හෝ ඊට ආසන්න දිනයකදී පෙත්සම්කරුට ගරු අමාත්‍යවරයාගේ (ලේකම් සඳහා) සහකාර ලේකම් විසින් 8වන වගඋත්තරකරු වෙත

යවන ලද ලිපියක පිටපතක් ලැබුණි. එම ලිපියෙන් ඔහු විසින්, පෙත්සම්කරුගේ ඉහත දැක්වෙන ලිපියෙහි සඳහන් කර ඇති කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන ලෙසද, පෙත්සම්කරුට උත්තරයක් යවන ලෙසද, ඉල්ලා සිටින ලදී. තවද, ඒ අනුව ගරු අග්‍රාමාත්‍යවරයාගේ දැන ගැනීම පිණිස එහි පිටපතක් යවන ලෙසද දන්වා සිට ඇත.

(ඉ) එසේ වුවද, ඉහත කී පරිදි 8වන වගඋත්තරකරුගෙන් උත්තරයක් නොලැබුණු අතර, 8වන වගඋත්තරකරු විසින් ගන්නා ලද ක්‍රියා මාර්ගය කුමක්දැයි පෙත්සම්කරු නොදනී.

පෙත්සම්කරු විසින් ගරු අග්‍රාමාත්‍යතුමා වෙත යවන ලද 2003.06.25 දින දරණ ලිපියේ පිටපතක් සහ ගරු අග්‍රාමාත්‍යතුමාගේ සහකාර ලේකම් (ලේකම් වෙනුවට) විසින් 8වන වගඋත්තරකරු වෙත යවනලද 2003.06.30 දරණ ලිපියේ පිටපතක් පිළිවෙලින් X5(a) සහ X5(b) ලෙස ලකුණු කොට මෙයට අමුණන අතර, ඒවා මෙහිම කොටසක් ලෙස සලකන මෙන් අයැද සිටිනු ලැබේ.

13. (අ) ඉන් අනතුරුව 2003 ජුලි හෝ තදාසන්න කාලයක දී අතිගරු ජනාධිපතිනිය විසින් වෙනත් දේ අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34වන ව්‍යවස්ථාව උල්ලංඝණය කරමින් සහ ජනාධිපති තුමිය වෙත පැවරී ඇති **"සමාවදීමේ"** අනන්‍ය අයිතිය උදුරාගනිමින් සහ/හෝ අන්සතු කරමින්ද, ***මුදල් විශෝධනයට සහ ත්‍රස්තවාදීන්ට සහ ත්‍රස්තවාදී ව්‍යාපාරයන්ට මුදල් උපයා දීමට අදාළ "ජාත්‍යන්තර නීති සහ ගිවිසුම්"*** උල්ලංඝණය කරමින් පනවා ඇති **2003 අංක. 10 දරණ පනත ඉවත් කරන ලෙස යෝජනා කරමින්** අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

(ආ) ජනාධිපතිවරයාගේ බලතල වලට අගතියක් නොවන පරිදි පළාත්බද ආණ්ඩුකාරවරයන්ට, පළාත් සභාවක ප්‍රඥප්තිය යටතේ සිදුකෙරෙන වරදවල් වලට සමාව දීමේ බලය පවරනු ලැබ ඇත. එසේ පවරනු ලැබ ඇත්තේ XVIIA පරිච්ඡේදය ඇතුළත් කරමින් විශේෂයෙන්ම එහි 154 ආ(9) ව්‍යවස්ථාව ඇතුළත් කරමින් පනවන ලද **13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ** 4වන ව්‍යවස්ථාව මගිනි.

(ඇ) 157 අ(1) ව්‍යවස්ථාව ඇතුළත් කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 6වන සංශෝධනයේ 3වන ව්‍යවස්ථාව මගින් කිසිදු තැනැත්තකු විසින්, ශ්‍රී ලංකාවේ දේශය තුළ වෙනම රජයක් පිහිටුවීමට **කෙළින්ම හෝ අන්‍යාකාරයකින්,** ශ්‍රී ලංකාව තුළදී හෝ ඉන් පිටතදී හෝ ආධාර කිරීම, අනුබලදීම, අනුග්‍රහය දැක්වීම, මුදල් යෙදවීම, ධෛර්යය දීම, දේශනා කිරීම නොකළ යුතුය. (සැලකිල්ල යොමු කෙරේ)

(ඈ) 2001.09.28 වන දින අංක. 1373 දරණ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුතියට අනතුරුව, 1968 අංක. 45 ද රණ එක්සත් ජාතීන්ගේ පනත යටතේ රජය විසින් 2001.10.16 වන දින නියෝග ගැසට් කරන ලදී. එම නියෝග මගින් **ත්‍රස්තවාදයට සහ ත්‍රස්තවාදී ව්‍යාපාරවලට අදාළ අරමුදල් රජය විසින් නවත්වා තහනමට ගැනීමට විධාන කරන ලදී.**

(ඉ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27 (15) දරණ ව්‍යවස්ථාවෙන් ජාතීන් අතර, කටයුතු කිරීමේදී රජය විසින් ජාත්‍යන්තර සාමය, සුරක්ෂිත භාවය සහ සහයෝගිතාව වර්ධනය කිරීමට උත්සහ ගත යුතුය.

14. (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 82(1) ව්‍යවස්ථාව මගින් මෙසේ නියම කර ඇත.

**" ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම් කිසි විධිවිධානයන් සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතක් වේ නම් එසේ පරිච්ඡින්න කරනු ලබන්නාවූ හෝ වෙනස් කරනු**

ලබන්නා වූ හෝ එකතු කරනු ලබන්නාවූ විධිවිධාන ද ආනුෂංගික සංශෝධනයක් වෙතොත් එයද පනත් කෙටුම්පතෙහි නිශ්චිතව ප්‍රකාශිතව ඇත්නම් මිස ද ඒ පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වන පනතක් බවට එහි දිර්ඝ නාමයෙහි විස්තර කොට ඇත්නම් මිසද, ඒ පනත් කෙටුම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වන පනතක් බවට එහි දිර්ඝ නාමයෙහි විස්තර කොට ඇත්නම් මිසද ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් නොකළ යුත්තේය" (සැලකිල්ල යොමු කෙරේ)

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 82(3) ව්‍යවස්ථාවෙහි මෙසේ නියම කර ඇත:-

**" කථානායකවරයාගේ මතය අනුව, යම්කිසි පනත් කෙටුම්පතක් මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ හෝ (2) වන අනු ව්‍යවස්ථාවේ හෝ නියමයන්ට අනුකූලව පිළියෙල වී නැත්නම් ඒ නියමයන්ට අනුකූල වන පරිදි ඒ පනත් කෙටුම්පත සංශෝධනය කරනු ලැබුවහොත් මිස ඒ පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට අවශ්‍ය පියවර නොගත යුතු යයි ඔහු විසින් විධාන කළ යුත්තේය. " (සැලකිල්ල යොමු කෙරේ)**

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 82(6) ව්‍යවස්ථාවෙහි මෙසේ නියම කර ඇත:-

**"යම්කිසි නීතියක යම්කිසි විධිවිධානයක් මේ ව්‍යවස්ථාවේ ඉහතින්ම වූ විධි විධානයන්ට අනුකූලව පනවනු ලැබුවහොත් මිස, එයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නැතහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයන් සම්මත නොවන්නේය. පරිච්චින්න නොවන්නේය. ප්‍රතියෝජනය නොවන්නේය. තවද, එසේ සංශෝධනය වන්නාක් සේ හෝ පරිච්චින්න වන්නාක් සේ හෝ ප්‍රතියෝජනය වන්නාක් සේ හෝ ප්‍රතියෝජනය වන්නාක් සේ හෝ නොසැලකිය යුත්තේය. තවද, එසේ අර්ථ නිරූපනය නොකළ යුත්තේය. තේරුම් නොගත යුත්තේය. "**

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(3) ව්‍යවස්ථාවෙහි මෙසේ නියම කර ඇත:-

**" එවැනි පනත් කෙටුම්පතක් නීතියක් ලෙස පනවන ලැබූ විට ඒ පනතින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නැතහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම්කිසි විධි විධානයක් සංශෝධනය නොවන්නේය. පරිච්ජින්න නොවන්නේය. ප්‍රතියෝජනය නොවන්නේය. තවද, ඒ පනතින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නැතහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයක් සංශෝධනය වන්නාසේ හෝ පරිච්ජින්න වන්නා සේ හෝ ප්‍රතියෝජනය වන්නාසේ හෝ නොසැලකිය යුත්තේය. තවද, එසේ අර්ථ නිරූපනය නොකළ යුත්තේය. තේරුම් නොගත යුත්තේය. එවැනි පනතක් පැමිණ ඡන්දය දෙන්නා වූ මන්ත්‍රිවරයන්ගේ බහුතර ඡන්දයෙන් ඉන්පසුව පරිච්ජින්න කළ හැක්කේය.** " (සැලකිල්ල යොමු කෙරේ).

15. (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව, විශේෂයෙන්ම 79වන සහ 82(3) වන ව්‍යවස්ථා අනුව, පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කෙරෙන පනත් කෙටුම්පත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අධිකාරයට, කාර්ය පටිපාටියට, සීමාවලට සහ තහනම් කිරීම් වලට එකඟ බවටද, **ඒ පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීමට සහ/හෝ ඒ පිළිබඳව ක්‍රියා කිරීමට සහ/හෝ සහතික කිරීමට කලින් අන්සතු කළ නොහැකි** (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(අ) ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 3වන ව්‍යවස්ථාව) ජනතාවගේ සෛවරිභාවය අන්සතු නොකර, **තමන් වෙනුවෙන් භාරය පිට ජනතාව විසින් පවරා දෙනු ලැබ ඇති " සීමිත ව්‍යවස්ථාදායක බලයේ "** පරිමාව ඇතුලත විය යුතු බවටද කථානායකවරයා සහතික විය යුතුය.

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 77(1) ව්‍යවස්ථාවෙහි මෙසේ නියම කර ඇත:-

" 82වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ සහ (2) වන අනුව්‍යවස්ථාවේ දැක්වෙන නියමයන් කඩවී ඇත්තේද යන වගද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නියම කොට ඇති විශේෂ බහුතර ඡන්දයෙන් විනා නීත්‍යානුකූලව සම්මත කළ නොහැකි විධි විධාන ඇතුළත් වී ඇත්තේද යන වගද දැන ගැනීම පිණිස සැම පනත් කෙටුම්පතක්ම පරීක්ෂා කර බැලීම නීතිපතිවරයාගේ කාර්යය වන්නේය. . . "

16. පෙත්සම්කරු තවදුරටත් මෙසේ ප්‍රකාශ කරයි:-

(අ) 7වන වගඋත්තරකරු සභාපතිවරයා වන්නාවූද 1994 අංක. 19 දරණ පනත යටතේ පිහිටුවනු ලැබුවාවූද, අල්ලස් හෝ දූෂණ පිළිබඳ චෝදනා විමර්ශනය කිරීම පිණිස වූ කොමිෂන් සභාව විසින් කරගෙන යනු ලබන විමර්ශණ වලට හෝ නඩු පැවරීම් වලට 2003 අංක. 10 දරණ පනත මගින් සමාව දීම/නිර්මුක්තිය/වගකීමෙන් නිදහස් කිරීම/සමා කරවීම සිදු නොකෙරේ.

(ආ) එසේම, වෙනත් තැනැත්තන් අතර, 1වන, 5වන, 7වන සහ 12වන වගඋත්තරකරුවන් විසින් බලාත්මක කරනු ලැබිය යුතු 1988 අංක. 74 දරණ පනතින් සංශෝධිත 1975 අංක. 1 දරණ වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ පරමාව යටතට ගැනෙන තැනැත්තන්ට 2003 අංක. 10 දරණ පනතින් සමාව දීම/වගකීමෙන් සඳහන් කිරීම/නිර්මුක්තිය/සමාකිරීම නොකෙරේ.

(ඇ) **1988 අංක. 74 දරණ පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක. 1 දරණ වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ පනත 2003 අංක. 10 දරණ පනතේ උපලේඛණගත ප්‍රඥප්තියක් නොවේ.**

(ඈ) මෙලෙසින් 1994 අංක. 20 දරණ පනතින් සංශෝධිත අල්ලස් පනතේ විෂය ප්‍රාත්‍රතාව යටත් ගැනෙන සහ 1988 අංක 74 දරණ පනතින් සංශෝධිත 1975 අංක. 1 දරණ වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ විෂය ප්‍රාත්‍රතාව යටතට ගැනෙන රාජ්‍ය නිලධාරීන්ට 2003 අංක. 10 දරණ පනතේ විධි විධාන යටතේ **සමාව/වගකීමෙන් නිදහස්වීම/නිර්මුක්තිය/සමාකිරීම ලබා ගැනීමට අපේක්ෂා කළ නොහැක.**

17. (අ) 1994 අංක. 19 දරණ පනතින්, 7වන වගඋත්තරකරු වත්මන් සභාපතිවරයා වන අල්ලස් හෝ දූෂණ පිළිබඳ චෝදනා පිළිබඳ විමර්ශණ කොමිෂන් සභාව පනත පිහිටුවන ලද අතර, එය 1994 ඔක්තෝම්බරයේදී ඒකමතිකව පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.

(ආ) ඒ අවස්ථාවේදී අදාල පනත කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරමින් අධිකරණ හා ව්‍යවස්ථා කටයුතු අමාත්‍යවරයා විසින් වෙනත් දේ අතර මෙසේ පැවසීය:-

**" ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අල්ලස් හා දූෂණවලට අදාලව අප රටේ විශාල කලකිරීමක් සහ වෛරයක් පැන නැඟී තිබෙන බව ඔබ දන්නෙහිය. එබැවින් මහජන මතයට අනුකූලව නීති රීති සෑදීම මේ රජයේ යුතුකම වේ "**

**මුදල් පිළිබඳ පටලැවීම් වලට අමතරව, අද මෙරටෙහි නුරුස්නාගතිය, තමාගේ උසස්කම් ගැන සිතන වෙනස්කම් කරන මතවාදී සිතුවිලි ඇති පුද්ගලයන් සිටීමේ ප්‍රශ්ණයද ඇත. අල්ලස් හා දූෂණ අප රටේ කොතෙක් මුල්බැස ගෙන ඇද්ද යත් මේ රටේ ජනතාව ඊට දක්වන ඉමහත් නොරිස්සීම නිදසුනකි. මෙම නින්දාශිලි ස්වභාවය ගැන අප කටයුතු නොකළහොත් අපේ රටේ දේශපාලන හා සමාජයීය ආයතනවල ස්ථිරත්වයට සහ පැවැත්මට අනිවාර්යය අනතුරක් ගෙන දෙයි. අල්ලස් සහ දූෂණ පිළිබඳ කරුණු වලට ඉමහත් ප්‍රතිචාරයක් තිබිය යුතු බවට රජය දැඩි ලෙස සලකන්නේ ඒ නිසාය.**

(ඇ) පාර්ලිමේන්තුවේදී ඉහත දැක්වෙන කෙටුම්පත් පනතට සහයෝගය දක්වමින් අග්‍රාමාත්‍යවරයා එවකට විරුද්ධ පක්ෂ නායකයා වශයෙන් වෙනත් දේ අතර මෙසේ ප්‍රකාශ කර සිටියේය:-

" ඇත්ත වශයෙන්ම අල්ලස් හා දූෂණ පිලිබඳ සම්පූර්ණ ප්‍රශ්ණයම ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක මූලික ප්‍රශ්ණ සමූහයක් උද්ගත කරයි. අල්ලස වූ කලී ප්‍රජාතාන්ත්‍රික සමාජයක පිලිකාව බව අප සියල්ලන් විසින් වටහා ගත යුතුය. අප මුහුණ දෙන විශාලතම ගැටළුවක් වශයෙන් තෝරා පත්කරගත් නියෝජිතයන්ට සහ රජයේ නිලධාරීන්ටද රාජ්‍ය සේවකයන් වශයෙන් ඔවුන්ගේ තීරණ දේශපාලන අවශ්‍යතා අනුව නොව මූල්‍ය ඉපැයීම් සහ මුදල්මය ලාභ ප්‍රයෝජන අනුව ගැනීමට සිදුව ඇත. "

(ඈ) ඉහත දැක්වෙන ප්‍රකාශවලින් අල්ලස් හා දූෂණ මැඩලීම පිණිස ඉහත කී නීතිය පැනවීම <u>ඒකමතිකව</u> සම්මත කර ගැනීමට තිබුණු චේතනාව පැහැදිළි වේ.

1994.10.04 දින හැන්සාඩ් තීරු 280 සිට 288 දක්වා වූ කොටසේ සහ 1994.10.05 වන දින හැන්සාඩ් තීරු 401 සිට 412 දක්වා වු කොටසේ සත්‍ය පිටපත් X6(a) හා X6(b) ලෙස ලකුණු කොට මෙයට අමුණන අතර ඒවා මෙහිම කොටසක් ලෙස සලකන මෙන් අයැද සිටිනු ලැබේ.

18. පෙත්සම්කරු විසින් ලෝක බැංකුව වෙත කරන ලද නියෝජිතයන්ගෙන් පසු, ලෝක බැංකුවේ සභාපතිවරයාගේ උපදෙස් මත එහි ශ්‍රී ලංකාව සඳහා වූ දේශීය වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරියාගෙන් පෙත්සම්කරුට ලැබුණු 2002.09.25 දින දරණ ලිපියේ සඳහන් වේ:-

" ඔබගේ ලිපියේ සඳහන් කර ඇති පරිදි, ලෝක බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරත්වයද මෙම ආයතනයේ සියළු කාර්යය මණ්ඩලයද <u>අල්ලස් හා දූෂණ පිළිබඳ කාරණය ඉතා දැඩි ලෙස සැලකිල්ලට ගනී</u>. තවද, මේ අවුරුද්දේ මොන්ටෙරිහිදි පවත්වන ලද රැස්වීමේදී සංවර්ධනය වන රටවල ප්‍රජාව විසින් මේ කාරණය පිළිගන්නා ලද විශේෂයෙන්ම සංවර්ධනය වන රටවල් මොන්ටේරිහිදි මෙසේ පැවසීය. සංවර්ධනය සඳහා වූ ආධාර ලැබීමට නම් අපට අපගේ රටවල් නිවැරදි කර ගැනීමට සිදුවේ. අපට අපගේ මිනිස් ධාරිතාව ගොඩනගා ගැනීමට තිබේ. අපට අපගේ නෛතික පද්ධතිය ගැන ක්‍රියා කිරීමට හැකි අතර, අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට තිබේ. තවද, <u>අපට ඉතා පැහැදිලිව පෙනෙන මූල්‍යක්‍රම තිබිය යුතු අතර, අප විසින් දූෂණයට එරෙහිව කටයුතු කළ යුතුය."</u> (සැලකිල්ල යොමු කෙරේ)

ලෝක බැංකුවෙන් පැමිණිලිකරුට ලැබුණු 2002.09.25 දින දරණ එකී ලිපියේ සත්‍ය පිටපතක් X7 යනුවෙන් ලකුණු කොට මෙයට අමුණන අතර, එය මෙහිම කොටසක් ලෙස සලකන මෙන් අයැද සිටිනු ලැබේ.

19. ඉහත දැක්වෙන කරුණු නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28වන ව්‍යවස්ථාවේ නියමයන් අනුව සිටි කාර්යය සහ යුතුකම් නිසි ලෙස ඉටු කිරීමට සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාව ප්‍රකාරව ගරු කටයුතු ඔබතුමියගේ අධිකරණය වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරවීම පිණිසද ඔබතුමියගේ ගරු අධිකරණයෙන් පහත දැක්වෙන සර්යෝරාරි තහනම් සහ මැන්ඩාමුස් රිට් ආඥා සහ අතුරු තහනම් නියෝග ලබා ගැනීම පිණිසද අවශ්‍ය වී තිබේ:-

(අ) <u>2003.07.01</u> දින සිට <u>2003.08.31</u> දින දක්වා අතර කාලයේදී ප්‍රකාශකරුවන් විසින් 1වන වගඋත්තරකරු වෙත කරනලද ප්‍රකාශ මත 2003 අංක. 10 දරණ පනත යටතේ 1වන සහ/හෝ , 2වන සහ/හෝ, 3වන සහ/හෝ, 4වන සහ/හෝ,5වන සහ/හෝ, 6වන සහ/හෝ, 8වන සහ/හෝ 9වන වගඋත්තරකරුවන් විසින් සහ/හෝ ඔවුන්ගේ බලයලත් නිලධාරීන් , නියෝජිතයන්, සේවකයන් සහ ඔවුන් යටතේ ක්‍රියා කරන සියල්ලන් විසින් කරන ලද හෝ වූ කරන ලද කවරාකාරවූ හෝ සියළු ක්‍රියා කටයුතු, කාරණා සහ දේවල් අහෝසි කරමින් සර්ටියෝරාරි රිට් ආඥාවක්,

(ආ) 2003 අංක. 10 දරණ පනත යටතේ 1වන වගඋත්තරකරු වෙත ප්‍රකාශ ඉදිරිපත් කළ ප්‍රකාශකවරුන්ට, 2වන සහ/හෝ, 3වන සහ/හෝ, 4වන සහ/හෝ,5වන සහ/හෝ, 6වන සහ/හෝ, 8වන සහ/හෝ 9වන සහ/හෝ 12වන වගඋත්තරකරුවන් විසින් ඒ ප්‍රකාශකවරුන් පිලිබඳ විමර්ශණවලින්/නඩු පැවරීම් වලින්/වරදකරු කිරීම් වලින් නිදහස් කොට දෙන ලද්දාවූද,

i. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 314වන ව්‍යවස්ථාව යටතේ අතිගරු ජනාධිපතිවරයා විසින් පමණක් දිය හැකි වූද,

ii. දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි යම් වරදක් සම්බන්ධයෙන්වූද,

iii. මුදල් විශෝධනය, මුහුදු කොල්ලය, මත් ද්‍රව්‍ය හා ඖෂධ හුවමාරුකිරීම, නිති විරෝධි මත්පැන් පෙරීම, නීති විරෝධි මත්පැන් විකිණීම, අයථා මනුෂ්‍ය ගනුදෙනු කිරීම්, ත්‍රස්තවාදී ව්‍යාපාරවල මුදල් යෙදවීම සහ 12වන වගඋත්තරකරු විසින් තීරණය කරනු ලබන වෙනත් යම් වරදවල් සම්බන්ධයෙන් වූද,

(ඇ) 2003 අංක. 10 දරණ පනත යටතේ **2003.07.01** සිට **2003.08.31** දින දක්වා වූ කාලය තුළදී 1වන වගඋත්තරකරු වෙත ප්‍රකාශ භාරදුන් ප්‍රකාශකවරුන්ට ඔවුන්ගේ ප්‍රකාශ වෙනුවෙන් සමාවක් දීමෙන්/වගකීමෙන් නිදහස් කිරීමෙන්/ නිර්මුක්තියෙන්/සමාවදීමෙන්/2වන සහ/හෝ 3වන සහ/හෝ, 4වන සහ/හෝ, 5වන සහ/හෝ, 6වන සහ/හෝ, 8වන සහ/හෝ, 9වන සහ/හෝ, 12වන වගඋත්තරකරුවන්ට තහනම් කරමින් තහනම් රිට් ආඥාවක්,

(ඉ) 2003 අංක. 10 දරණ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව පසුගිය අවුරුදු 10ක කාලය තුළ රාජ්‍ය තනතුරු දැරුවාවූද, 1994 අංක. 20 දරණ පනතින් සංශෝධිත අල්ලස් පනතේ විෂය පථය තුළට ගැනෙන තැනැත්තන් විසින් සහ 2003 අංක. 10 දරණ පනත ක්‍රියාත්මක වීමේදිනයට පෙරාතුව පසුගිය අවුරුදු 10 තුළ ධුරය දැරුවා වූද, 1988 අංක. 74 දරණ පනතින් සංශෝධිත 1975 අංක. 1 දරණ වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ විෂය පථයට ගැනෙන්නාවූ ද, තැනැත්තන් විසින් 2003 අංක. 10 දරණ පනත යටතේ 1වන වගඋත්තරකරු තෙ කරන ලද ප්‍රකාශ 5වන සහ/හෝ 7වන සහ/හෝ, 12වන වගඋත්තරකරුවන් වෙත ඉදිරිපත් කරන ලෙස බලකරමින් සහ එකී ප්‍රකාශ සම්බන්ධයෙන් නීතියට අනුව ගතයුතු යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස බලකරමින් මැන්ඩාමුස් රිට් ආඥාවක්,

(ඊ) 2003.07.01 සිට 2003.08.31 දක්වා වූ කාලය තුළදී 1වන වගඋත්තරකරු වෙත ප්‍රකාශ භාරදුන් ප්‍රකාශක වරුන්ට 2003 අංක. 10 දරණ පනත යටතේ සමාවක්/වගකීමෙන් නිදහස් කිරීමක්/නිර්මුක්තියක්/සමාකිරීමක් දීමෙන් 1වන සහ/හෝ 2වන සහ/හෝ, 3වන සහ/හෝ, 4වන සහ/හෝ, 5වන සහ/හෝ, 6වන සහ/හෝ, 8වන සහ/හෝ, 9වන සහ/හෝ, 12වන වගඋත්තරකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නිලධාරීන්/නියෝජිතයන්/සේවකයන් සහ ඔවුන් යටතේ ක්‍රියා කරන සියල්ලන් වලක්වාලමින් අතුරු තහනම් නියෝගයක්,

(උ) (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34වන ව්‍යවස්ථාව යටතේ අතිගරු ජනාධිපතිවරයා විසින් පමණක් දිය හැකි වූද,

(iii) දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි යම් වරදක් සම්බන්ධයෙන් වූද,

(iv) මුදල් විශෝධනය, මුහුදු කොල්ලය, මත්ද්‍රව්‍ය හා ඖෂධ හුවමාරු කිරීම, නීති විරෝධි මැත්පැන් පෙරීම, නීති විරෝධි මත්පැන් විකිණීම, අයථා මනුෂ්‍ය

ගනුදෙනු කිරීම්, ත්‍රස්තවාදීන්ට සහ ත්‍රස්තවාද ව්‍යාපාරවල මුදල් යෙදවීම සහ 12වන වගඋත්තරකරු විසින් තීරණය කරනු ලබන වෙනත් යම් වරදවල් සම්බන්ධයෙන් වූද,

2003 අංක. 10 දරණ පනත යටතේ **2003.07.01** සිට **2003.08.31** දින දක්වා වූ කාලය තුළදී 1වන වගඋත්තරකරු වෙත ප්‍රකාශ භාරදුන් ප්‍රකාශකවරුන්ට ඔවන්ගේ ප්‍රකාශ වෙනුවෙන් සමාවක් දීමෙන්/ වගකීමෙන් නිදහස් කිරීමෙන්/නිර්මුක්තියෙන්/සමාව දීමෙන් 2වන සහ/හෝ 3වන සහ/හෝ, 4වන සහ/හෝ, 5වන සහ/හෝ, 6වන සහ/හෝ, 8වන සහ/හෝ, 9වන සහ/හෝ, 12වන වගඋත්තරකරුවන්ට තහනම් කරමින් අතුරු තහනම් නියෝගයක්,

20. මෙම කාරණය සම්බන්ධයෙන් ඔබතුමියගේ ගරු අධිකරණයේ අධිකරණ බලය මීට කලින් අයැද නැති බව පෙත්සම්කරු කියා සිටී.

21. කරුණු හෙළිදරව් කිරීම් වස් පෙත්සම්කරු මෙසේ ප්‍රකාශ කරයි:-

(අ) පෙත්සම්කරු විසින්, 2003 අංක. 10 දරණ පනත පැනවීම සම්බන්ධයෙන් ඉහත සඳහන් වගඋත්තරකරුවන්ද, ඇතුළුව වගඋත්තරකරුවන් ගණනාවකට විරුද්ධව අංක. එස්සී/එෆ්/ආර් ඉල්ලුම්පත් අංක. 194/2003 දරණ නඩුව ශ්‍රේෂ්ඨාධිකරණයෙහි ගොනු කර ඇත. එයතවමත් නිම නොවී පවතී.

(ආ) පෙත්සම්කරු විසින් එස්සී/එස්ඩී/අංක.11/2003 දරණ ඉල්ලීම ශ්‍රේෂ්ඨාධිකරණයෙහි ගොනුකරන ලදී. එම අධිකරණය 12වන වගඋත්තරකරු විසින් නගන ලද මූලික විරෝධතා පිළිගනිමින්, 12වන වගඋත්තරකරු විසින් නඟන ලද මූලික විරෝධතා අවශ්‍යයෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පිළිගන්නා බව තීරණය කොට **2003 අංක. 10 දරණ පනතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය තත්ත්වය තීරණය කිරීම සඳහා සිය අධිකරණ බලය යෙදීම ප්‍රතික්ෂේප කළේය.**

(ඇ) පෙත්සම්කරු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයෙහි එස්සී(එස්ඩී) ඉල්ලුම්පත් අංක. 20/2003 ගොනු කර සිටින ලදී. 12වන වගඋත්තරකරු නැවතත් මූලික විරෝධතා මතුකරමින් විරෝධය දැක්වූ අතර, ශ්‍රේෂ්ඨාධිකරණයේ 3 දෙනෙකුගෙන් යුත් විනිශ්චය මණ්ඩලය විසින් **2003 අංක. 10 දරණ පනතේ (2003.06.30 වන දිනෙන් අවසන් වූ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වලංගුභාවය පරීක්ෂාකර නොබලා 2003.07.01 දින පසුව අදාලවීම පිණිස වූ සහ පළමුවන තැනැත්තන් කණ්ඩායමට සම්පූර්ණයෙන් වෙනස් කාණ්ඩයක් වෙත දීර්ඝ කරන ලද සංශෝධන පනත ආණ්ඩුකම ව්‍යවස්ථාවට අනුකූල බවට තීරණය කරන ලදී.**

ඉහත කී කරුණු නිසා, සිය පෙත්සමෙහි සඳහන් කරන ලද හේතු නිසා ඉහත කී කාරණය ශ්‍රේෂ්ඨාධිකරණයෙහි වඩාත් පූර්ණ විනිශ්චය මණ්ඩලයක් විසින් නැවත පරීක්ෂා කර බලනු පිණිස, පෙත්සම්කරු විසින් 2003.09.12 වන දින ඉල්ලුම්පතක් ගොනු කර සිටින ලදී.

අමුණන ලද ලේඛණ නොමැති ඉහත සඳහන් ඉල්ලීමේ සත්‍ය පිටපත් X8 යනුවෙන් ලකුනු කොට මෙයට අමුණන අතර, එය මෙහිම කොටසක් ලෙස සලකන මෙන් අයැද සිටිනු ලැබේ.

(ඈ) පෙත්සම්කරුගේ ඉහත කී ඉල්ලීමෙහි (X8) සම්ප්‍රකාශ තහවුරු කිරීම පිණිස සහ පෙත්සම්කරු විසින් ගන්නා ලද පියවර තහවුරු කිරීම සඳහා පෙත්සම්කරු විසින් ඔහුගේ 2003.09.26 දින දරණ මෝසම මගින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත, මැදිහත් වන පෙත්සම්කරු වකු ලෙස පුද්ගලිකවම පෙනී සිටි එස්ඩී(එස්ඩී) අංක. 22/2003 හා 23/2003 දණ ඉල්ලීම් වලදී ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් 5 දෙනෙකුගේ

විනිශ්චය මණ්ඩලයක් විසින් කරන ලද (පාර්ලිමේන්තුවේ කථානායක විසින් 2003.09.23 වන දින දැනුම් දෙන ලද) තීරණ දැනුම් දෙන ලදී.

එකී තීරණවලදී ශ්‍රේෂ්ඨාධිකරණයේ 5 දෙනෙකුගේ විනිශ්චය මඩුල්ල විසින්, ප්‍රධාන ප්‍රඥප්තියක විධි විධාන "අළුත් තැනැත්තන් කණ්ඩායමක්"/ " අළුත් ගනුදෙනු සමූහයක් " වෙත දීර්ඝ කිරීමේ අනනුකූලතාවය පරීක්ෂා කොට තීරණය කිරීමට යෙදී ඇත. තවද, වෙනත් කරුණු අතර, සංශෝධනයක් තනිවම ගත නොහැකි බවත්, සංශෝධනයකට බලාත්මකව පවත්නා පනතකින් ස්වකීය ව්‍යවස්ථාදායක වලංගුභාවය තහවුරු කර ගැනීමට ඇත්තටම නොහැකි බවට තීරණය කර ඇත. වෙනත් දේ අතර, අධිකරණය විසින්, හෘදය සාක්ෂියට විරුද්ධ නීතිය කපා හරින බවත් නීතියකින් බලවතා තවදුරටත් බලවත් කිරීමක් හෝ දුබලයා තවදුරටත් දුබල කිරීමක් සිදු නොවන බව පවසා ඇත.

2003.09.25 වන දින දරණ මෝසමේ සහ ඉහත කී තීරණ දෙකේ සත්‍ය පිටපත් පිළිවෙලින් ඉහතකී තීරණ දෙකේ සත්‍ය පිටපත් පිළිවෙලින් X9,X10(a) හා X10(b) ලෙස ලකුණු කොට මෙයට අමුණන අතර, එය මෙහිම කොටසක් ලෙස සලකන මෙන් අයැද සිටිනු ලැබේ.

(ඉ) **ඒ අනුව, පෙත්සම්කරු කියා සිටින්නේ, 2003 අංක. 10 දරණ පනතේ <u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වලංගුභාවය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පරීක්ෂා කර බලා නැති බවය.</u>**

22. මෙහි ඇතුළත් සම්ප්‍රකාශ තහවුරු කිරීම පිණිස පෙත්සම්කරුගේ දිවුරුම් ප්‍රකාශය මෙයට අමුණා ඇත.

<u>**එමනිසා**</u> පෙත්සම්කරු ඔබතුමියගේ ගරු අධිකරණයෙන් මෙසේ අයැද සිටී:-

(අ) වගඋත්තරකරුවන් වෙත දැන්වීම් නිකුත් කරන ලෙසත්,

(ආ) 2003.07.01 දින සිට 2003.08.31 දින දක්වා වූ කාලය තුළ 2003 අංක. 10 දරණ පනත යටතේ 1වන වගඋත්තරකරු වෙත ප්‍රකාශකරුවන් විසින් කරන ලද ප්‍රකාශ මත 1වන සහ/හෝ, 2වන සහ/හෝ, 3වන සහ/හෝ, 4වන සහ/හෝ, 5වන සහ/හෝ, 6වන සහ/හෝ, 8වන සහ/හෝ, 9වන සහ/හෝ 12වන වගඋත්තරකරුවන් විසින් සහ/හෝ ඔවුන්ගේ බලයලත් නිලධාරීන් නියෝජිතයන්, සේවකයන් සහ ඔවුන් යටතේ ක්‍රියා කරන සියල්ලන් විසින් කරනලද හෝ ඉටු කරන ලද කවරාකාරවූ හෝ සියළු ක්‍රියා, කටයුතු, කාරණා සහ දේවල් අහෝසි කරමින් සර්ටියෝරාරි රිට් ආඥාව නිකුත් කරන ලෙසත්,

(ඇ) 2003 අංක. 10 දරණ පනත යටතේ 1වන වගඋත්තරකරු වෙත ප්‍රකාශ ඉදිරිපත් කළ ප්‍රකාශකවරුන්ට 2වන සහ/හෝ, 3වන සහ/හෝ, 4වන සහ/හෝ, 5වන සහ/හෝ, 6වන සහ/හෝ, 8වන සහ/හෝ, 9වන සහ/හෝ 12වන වගඋත්තරකරුවන් විසින් ඒ ප්‍රකාශකවරුන් පිළිබඳ විමර්ශණවලින්/නඩුපැවරීම් වලින්/වරදකරු කිරීම්වලින් නිදහස් කොට දෙන ලද්දාවූද,

i. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34වන ව්‍යවස්ථාව යටතේ අතිගරු ජනාධිපතිවරයා විසින් පමණක් දිය හැකි වූද,

ii. දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඩුවම් කරනු ලැබිය හැකි යම් වරදක් සම්බන්ධයෙන් වූද,

iii. මුදල් විශෝධණය, මුහුදු කොල්ලය, මත් ද්‍රව්‍ය හා ඖෂධ හුවමාරුව, නීති විරෝධි මත්පැන් පෙරීම, නීති විරෝධී මත්පැන් විකිණීම, අයථා මනුෂ්‍ය ගණුදෙනු කිරීම්, ත්‍රස්තවාදීන් සහ ත්‍රස්තවාදී ව්‍යාපාරවල මුදල් යෙදවීම සහ 12වන වගඋත්තරකරු විසින් තීරණය කරනු ලබනතෙක් වෙනත් යම් වරදවල් සම්බන්ධයෙන් වූද,

කිසියම් සමාවක්/වගකීමෙන් නිදහස් කිරීමක්/නිර්මුක්තියක්/සමාව දීමක් අහෝසි කරමින් සර්ටියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත්,

(ඈ) 2003.07.01 සිට 2003.08.31 දක්වා වූ කාලය තුළ 2003 අංක. 10 දරණ පනත යටතේ 1වන වගඋත්තරකරු වෙත ප්‍රකාශ භාරදුන් ප්‍රකාශකවරුන්ට සමාවක්/වගකීමෙන් නිදහස් කිරීමක්/නිර්මුක්තියක්/සමාකිරීමක් දීමෙන් 1වන සහ/හෝ 2වන සහ/හෝ, 3වන සහ/හෝ, 4වන සහ/හෝ, 5වන සහ/හෝ, 6වන සහ/හෝ, 8වන සහ/හෝ, 9වන සහ/හෝ, 12වන වගඋත්තරකරුවනද නැතහොත් ඔවුන්ගේ බලයලත් නිලධාරීන්/නියෝජිතයන්/සේවකයන් සහ ඔවුන් යටතේ ක්‍රියා කරන සියල්ලන් වලක්වාලමින් තහනම් රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත්,

(ඉ) i. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34වන ව්‍යවස්ථාව යටතේ අතිගරු ජනාධිපතිවරයා විසින් පමණක් දිය හැකිවුද,

ii. දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි යම් වරදක් සම්බන්ධයෙන් වූද,

iii. මුදල් විරෝධනය, මුහුදු කොල්ලය, මත් ද්‍රව්‍ය හා ඖෂධ හුවමාරුව, නීති විරෝධි මත්පැන් පෙරීම, නීති විරෝධි මත්පැන් විකිණීම, අයථා මනුෂ්‍ය ගනුදෙනු කිරීම්, ත්‍රස්තවාදීන්ට සහ ත්‍රස්තවාදි ව්‍යාපාරවලට මුදල් යෙදවීම සහ 12වන වගඋත්තරකරු විසින් තීරණය කරනු ලබන වරදවල් සම්බන්ධයෙන් වූද,

2003 අංක. 10 දරණ පනත යටතේ 2003.07.01 දින සිට 2003.08.31 දින දක්වා වූ කාලය තුළ 1වන වගඋත්තරකරු වෙත ප්‍රකාශ භාරදුන් ප්‍රකාශකවරුන්ට ඔවුන්ගේ ප්‍රකාශ වෙනුවෙන් සමාවක් දීමෙන්//වගකීමෙන් නිදහස් කිරීමෙන්/ නිර්මුක්තියෙන්/සමාකිරීමෙන් 2වන සහ/හෝ, 3වන සහ/හෝ, 4වන සහ/හෝ, 5වන සහ/හෝ, 6වන සහ/හෝ, 8වන සහ/හෝ, 9වන සහ/හෝ, 12වන වගඋත්තරකරුවන්ට තහනම් කරමින් රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත්,

(ඊ) 2003 අංක. 10 දරණ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව පසුගිය අවුරුදු 10ක කාලය තුළ රාජ්‍ය තනතුරු දැරුවාවූද, 1994 අංක. 20 දරණ පනතින් සංශෝධිත අල්ලස් පනතේ විෂය පථය තුළට ගැනෙන තැනැත්තන් විසින් සහ 2003 අංක. 10 දරණ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව පසුගිය අවුරුදු 10 තුළ ධුරය දැරුවා වූද, 1988 අංක. 74 දරණ පනතින් සංශෝධිත 1975 අංක. 1 දරණ වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ විෂය පථයට ගැනෙන්නාවූ ද, තැනැත්තන් විසින් 2003 අංක. 10 දරණ පනත යටතේ 1වන වගඋත්තරකරු වෙත කරන ලද ප්‍රකාශ 5වන සහ/හෝ 7වන සහ/හෝ, 12වන වගඋත්තරකරුවන් වෙත ඉදිරිපත් කරන ලෙස බලකරමින් සහ එකී ප්‍රකාශ සම්බන්ධයෙන් නීතියට අනුව ගතයුතු යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස බලකරමින් මැන්ඩාමුස් රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත්,

(උ) 2003.07.01 සිට 2003.08.31 දක්වා වූ කාලය තුළ 2003 අංක. 10 දරණ පනත යටතේ 1වන වගඋත්තරකරු වෙත් ප්‍රකාශ භාරදුන් ප්‍රකාශකවරුන්ට සමාවක්/වගකීමෙන් නිදහස් කිරීමක්/නිර්මුක්තියක්/සමාකිරීමක් දීමෙන් 1වන සහ/හෝ 2වන සහ/හෝ, 3වන සහ/හෝ, 4වන සහ/හෝ, 5වන සහ/හෝ, 6වන සහ/හෝ, 8වන සහ/හෝ, 9වන සහ/හෝ, 12වන වගඋත්තරකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නිලධාරීන්/නියෝජිතයන්/සේවකයන් සහ ඔවුන් යටතේ ක්‍රියා කරන සියල්ලන් වලක්වාලමින් අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන ලෙසත්,

(ඌ) i. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34වන ව්‍යවස්ථාව යටතේ අතිගරු ජනාධිපතිවරයා විසින් පමණක් දිය හැකිවුද,

ii. දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි යම් වරදක් සම්බන්ධයෙන් වූද,

iii. මුදල් විශෝධනය, මුහුදු කොල්ලය, මත් ද්‍රව්‍ය හා ඖෂධ හුවමාරුව කිරීම, නීති විරෝධී මත්පැන් පෙරීම, නීති විරෝධී මත්පැන් විකිණීම, අයථා මනුෂ්‍ය ගනුදෙනු කිරීම්, ත්‍රස්තවාදීන්ට සහ ත්‍රස්තවාදී ව්‍යාපාරවලට මුදල් යෙදවීම සහ 12වන වගඋත්තරකරු විසින් තීරණය කරනු ලබන වරදවල් සම්බන්ධයෙන් වූද,

2003 අංක. 10 දරණ පනත යටතේ 2003.07.01 දින සිට 2003.08.31 දින දක්වා වූ කාලය තුළදී 1වන වගඋත්තරකරු වෙත ප්‍රකාශ භාරදුන් ප්‍රකාශකවරුන්ට ඔවුන්ගේ ප්‍රකාශ වෙනුවෙන් සමාවක් දීමෙන්/වගකීමෙන් නිදහස් කිරීමෙන්/ නිර්මුක්තියෙන්/සමාකිරීමෙන් 2වන සහ/හෝ, 3වන සහ/හෝ, 4වන සහ/හෝ, 5වන සහ/හෝ, 6වන සහ/හෝ, 8වන සහ/හෝ, 9වන සහ/හෝ, 12වන වගඋත්තරකරුවන්ට තහනම් කරමින් අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන ලෙසත්,

(එ) නඩු ගාස්තු ලබාදෙන ලෙසත්, සහ,

(ඒ) මෙම අධිකරණයට සුදුසු යයි හැඟෙන වෙනත් සහ තවදුරටත් වූ සහන ලබාදෙන ලෙසත්ය.

පෙත්සම්කරුගේ නීතිඥවරුන්

**<u>සකස් කලේ,</u>**

නීතිඥ විරාන් කොරෙයා මහතා.
නීතිඥ වින්ද්‍යා වීරසේකර මහත්මිය,
නීතිඥ එම්.ඒ.සුමන්තිරන් මහතා